

# කොවිඩ් වසංගතයෙන් පසුකාලීන ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා

POLICY BRIEF

COVID-19 වසංගතය සහ ආර්ථික අර්බුදය ජනතාවගේ සෞඛ්‍ය අයිතියට ඇති කරන ලද බලපෑම සම්බන්ධයෙන් ගවේෂණය කිරීම සඳහා නීතිය සහ සමාජ භාරය විසින් අධ්‍යයනයක් සිදු කෙරිණ. සෞඛ්‍යය, අධ්‍යාපනය, ජීවනෝපායන්, සාමකාමී සහජීවනය සහ යහපාලනය සඳහා ඇති අයිතිය ඇතුළත් මානව ආරක්ෂාව සුරක්ෂිත කිරීමට අර්ථවත් ආකාරයකින් සාමූහිකව දායක විය හැකි වන පරිදි, පුරවැසියන් සහ රාජ්‍යය අතර මෙන්ම පුරවැසියන් අතරද වන සමාජ සම්මුතීන් සම්බන්දයෙන් නැවත සලකා බැලීමේ අවශ්‍යතාවය පිළිබඳව ඔවුන් අපව දැනුවත් කළහ. සෞඛ්‍ය අයිතිය ඇතුළුව අපගේ මූලික මානව හිමිකම් සැමට එක ලෙසින් භුක්ති විඳීමේ හැකියාව සහතික කිරීම සඳහා අපගේ මානව සහ මූල්‍ය සම්පත් ක්‍රමාංකනය කළ හැකි ආකාරය පිළිබඳව විවෘත සංවාදයක් මෙන්ම නව අදහස් සහ උපාය මාර්ග අවශ්‍ය වේ. මෙම අධ්‍යයනයෙන් රෝගීන්ගේ අයිතිවාසිකම්, මහජන සෞඛ්‍ය, හදිසි අවස්ථා කළමනාකරණය සහ මානසික සෞඛ්‍ය ගැටළු හඳුනා ගැනීම මෙන්ම ඒවාට ප්‍රතිකාර කිරීම් වැඩිදියුණු කිරීම පිළිබඳ ප්‍රඥප්තියක් සම්බන්දයෙන් වන වැදගත් කරුණු අනාවරණය කෙරේ.

LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය
சட்டம் மற்றும் சமூக நம்பிக்கை

info@lstlanka.org

කොවිඩ් වසංගතයෙන් පසුකාලීන

# ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා

## හැඳින්වීම

කොවිඩ් වසංගතය පෙර නොවූ විරූ ව්‍යසනයක් විය. කොවිඩ් වෛරසය මාස කිහිපයක් ඇතුළත ලෝකයේ සෑම රටකට ම පැතිර යමින් ලොව පුරා සෑම තැනක ම සෞඛ්‍ය සේවා පද්ධති සහ ආර්ථිකයන් විනාශ කරන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය වශයෙන් සමාජ පාලනය දැඩි කරන ලද අතර මිනිසුන්ට නිවසේ රැඳී සිටීමටත්, මුඛ ආවරණ පැළඳීමටත්, පරීක්ෂණවලට සහ නිරෝධායනයට භාජනය වීමටත්, එන්නත් ලබා ගැනීමටත් බල කරන ලදී. මෙම වසංගතයෙහි බලපෑම හේතුවෙන් බොහෝ දෙනෙකුට තම ජීවනෝපායන් සහ ආදායම් අහිමි වූ අතර මිනිසුන්ට ආහාර, සාමාන්‍ය සෞඛ්‍ය සේවා සහ අනෙකුත් අත්‍යවශ්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීමේ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු විය. කෙසේ වෙතත්, ගෝලීය වශයෙන් වසංගතයට දක්වන ලද ප්‍රතිචාර ඒකාකාර නොවූ අතර විවිධ රටවල් විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගවල තිබූ විවිධත්වය මගින්, වසංගත ප්‍රතිචාරයක් පුරවැසියන්ගේ මානව හිමිකම් සමග සමබර කිරීමේ දී අනුගත කර ගත හැකි ප්‍රතිපත්ති විකල්පවල විවිධත්වය පිළිඹිබු කළේ ය.

කොවිඩ් වසංගතය පැතිරීමට හේතු වූයේ පැතිරීමේ හැකියාව අතින් අසමසම වූ කලින් නොදැන සිටි මාරාන්තික වෛරසයක් වූ බැවින් එම රෝගය මගින් ඇතිකරන ලද භීතිය සහ තැතිගැන්ම නිසා වසංගතයට ශක්තිමත් ප්‍රතිචාර දක්වන ලෙස මිනිසුන් තම රජයන්ගෙන් ඉල්ලා සිටි අතර, එය ප්‍රජාවන්ට විෂම ලෙස බලපාන ක්‍රියාමාර්ග විශේෂයෙන් ම සමාජ ආර්ථික විෂමතා ඔස්සේ බලපාන ක්‍රියාමාර්ග ගැනීම සාධාරණීකරණය විය. වඩාත්ම පැහැදිලිව පෙනී ගිය කරුණ වන්නේ, ඇඳිරි නීතිය පැනවීම සහ රට වසා දැමීම හරහා බලාත්මක කරන ලද සමාජ හුදකලා කිරීම් පවුල්වල ආදායම් මාර්ග කෙරෙහි විෂම බලපෑම් ඇති කිරීමත් ඇතමුන්ට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා (ආහාර, ඖෂධ සහ බලශක්තිය වැනි) අඛණ්ඩ ප්‍රවේශයක් භුක්ති විඳීමට හැකි වූ නමුත් තවත් ඇතමුන්ට කුසගින්නෙන්, අසනීපයෙන් සහ අසරණභාවයට පත්ව ජීවත් වීමට සිදුවීමත් යි මෙම බලපෑම් වසංගතයට ප්‍රතිචාර වශයෙන් රජය විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගවලට ඍජුව ම සම්බන්ධ වන අතර, ජනගහනයෙන් සැලකිය යුතු කොටසකට ඒවායින් ඇතිවන සමාන්තර බලපෑම් සංසන්දනය කිරීමේ දී එමගින් වසංගත ප්‍රතිචාරවල ඵලදායීත්වය සහ සාධාරණත්වය පිළිබඳ ප්‍රශ්න මතු කරයි.

දැන් වසංගතයේ නරක ම තත්ත්වය අවසන් වී ඇති බැවින් වසංගතයට ප්‍රතිචාර දැක්වීමේ දී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග ඒවා ජනතාව කෙරෙහි ඇති කර තිබෙන බලපෑම් සහ එම බලපෑම් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමට ඇති මාර්ග පිළිබඳ සිතා බැලීම අත්‍යාවශ්‍ය වේ. අනාගතයේ දී මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා නැවත ඇති විය හැකි බැවින් කොවිඩ් වසංගතයේ අත්දැකීම ශ්‍රී ලංකා සමාජයට එම අවස්ථා සාධාරණ ලෙස කළමනාකරණය කරන්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීම සඳහා යොදා ගත හැකි ඉගෙනුම් අවස්ථාවක් ලෙස වැදගත් වෙයි. සමාජයේ ධනවත් නැතහොත් වඩා පොහොසත් කොටස්වලට වාසිදායක වන ආකාරයෙන් ඔවුන්ට පක්ෂපාතී වූ සියලු කොටස් නියෝජනය නොවන සහ සාමාන්‍යකරණය කරන ලද **"පොදු යහපතක්"** වෙනුවෙන් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග වලින් ජනගහනයේ සමාජ ආර්ථික තත්ත්ව පරාසයෙහි වඩා දිළිඳු අන්තයන්හි සිටින කොටස් ආරක්ෂා කරනු ලබන බව සහතික කළ යුතුය.

මෙම සන්දර්භය තුළ '**වසංගතය තුළ යුක්තිය සහ සෞඛ්‍යය සඳහා ඇති අයිතිය**' පිළිබඳ මහජන කොමිසම විසින් සෞඛ්‍ය අංශය ප්‍රතිසංස්කරණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් හඳුනාගෙන ඇති ඒවා පහත සඳහන් පරිදි වේ:

- කොවිඩ් අර්බුදය අතරතුර සිදුවී ඇති මානව හිමිකම් උල්ලංඝනයවීම් හඳුනාගැනීම;
- අනාගත මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා සඳහා අයිතිවාසිකම්වලට ගරු කරන සහ අන්තර්කරණය වූ ආකාරයකින් සූදානම් වීම;
  සහ
- සෞඛ්‍යය සඳහා ඇති අයිතිය සහ සමාජ ආරක්ෂණ ඒකාබද්ධ කිරීම.

කොවිඩ් වසංගතයෙන් පසුකාලීන

# ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා

## කොවිඩ් අර්බුදය අතරතුරදී සිදුවූ මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිගැනීම

2024 වර්ෂයේ දී මහජන කොමිසම විසින් සිදු කරන ලද මහජන අදහස් විමසීම් මගින් කොවිඩ් වසංගතය පැවති කාල පරිච්ඡේදය තුළ සිදු වූ මානව හිමිකම් උල්ලංඝනයවීම් රාශියක් ලේඛනගත කරන ලදී. එම උල්ලංඝනයවීම් විඳදරා ගත් අයගේ මතකයන් තුළට ඒවා තදින් කාවැදී ඇති බැවින් ශ්‍රී ලංකාව රටක් ලෙස එම උල්ලංඝනයවීම් හඳුනා නොගෙන ඉදිරියට නොයා යුතු අතර මෙම හඳුනා නොගත් මතකයන් ගැටුම් කාලවලදී පැහැදිලිව ප්‍රකාශ වන අපගේ සමාජයේ ඉරිතැලීම් ඇතිවීමට දායක වේ. වඩාත් ම වැදගත් කරුණ වන්නේ සමාජයක් ලෙස ශ්‍රී ලාංකිකයන් එකිනෙකාට ගරුත්වය දැක්වීම වන අතර එම ගරුත්වය අහිමි වීම අප සැමට එක හා සමාන අවනම්බුවක් සහ අවමානයක් වනු ඇත. හිතාමතා ම හෝ එසේ නොමැතිව අප අතරින් ඇතැම් කොටස් වෙත අනෙක් අය විසින් කරනු ලබන අපහාසවල ගැඹුර හඳුනා ගැනීම නොසලකා හැරීම එම අපහාසයන් තව තවත් උග්‍රවීමට හේතු වන අතර එය ඉදිරියේ දී සමාජයක් ලෙස අපගේ සෞඛ්‍යයට අහිතකර වනු ඇත. පුද්ගලික අයිතියක් පමණක් නොව සාමූහික අයිතියක් ද වන සෞඛ්‍යය සඳහා ඇති අයිතියට රෝග සුව කිරීම පමණක් නොව පුළුල්, වඩාත් පරිපූර්ණ අර්ථයකින් ගත් කල යහපැවැත්ම ද අයත් වන අතර එහිදී එයට සමස්තයක් ලෙස සුව වීම සඳහා සමාජයට ඇති අවශ්‍යතාවය සහ අයිතිය ද ඇතුළත් වෙයි.ඇත්ත වශයෙන් ම මානව හිමිකම් උල්ලංඝනය වීමේ සිදුවීම් මගින් විශේෂයෙන් ම අයිතිවාසිකම් ගැන කථා කරන විට **'අයිතියක් ඇති තැන - සැමවිටම - ප්‍රතිකර්මයන් ඇත'** යනුවෙන් පැවසෙන සුව කරන්නන්ගෙන් ණයට ගත් ප්‍රතිකර්ම භාෂාව ඉපදවීම අහම්බයක් නොවිය හැකි ය.

මානව හිමිකම් උල්ලංඝනය වීම් සිදුවන සෑම සිදුවීමක් ම කුහකත්වය හෝ වෙනත් ද්වේෂ සහගත චේතනාවක් පදනම් කර ගෙන සිදුකරන්නේ යැයි නොසැලකිය යුතු බව හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වුවද ඇතැම් ක්‍රියාමාර්ග විශේෂයෙන් ම විශේෂඥ උපදෙස් හමුවේ පවා එම උපදෙස්වලට පටහැනිව අඛණ්ඩව ක්‍රියාත්මක වන ඒවා ද්වේෂ සහගත බව පෙනෙන්නට තිබුණි. අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනයවීම් සිදුවී ඇත්තේ වෛරසය පැතිරීම සීමා කිරීමේ පටු අරමුණින්, රජය විසින් නිකුත් කරන ලද නියෝග කඩිමුඩියේ, සැලසුම් නොකර, නැතහොත් පමණට වඩා වැඩි අධික උනන්දුවකින් යුතුව ඒවායෙහි අතුරු බලපෑම් ප්‍රමාණවත් ලෙස සැලකිල්ලට නොගෙන ක්‍රියාත්මක කිරීම හේතුවෙනි. බොහෝ නිලධාරීන් පෙර නොවූ විරූ ගෝලීය අර්බුදය පුරා වෙහෙස නොබලා සේවය කළ අතර, තවත් සමහරු පද්ධතියේ ඇති අඩුපාඩු තම වාසියට හරවා ගනිමින් කටයුතු කළ අතර එය සෞඛ්‍ය පද්ධතිය කෙරෙහි ඇති විශ්වාසය ඛාදනය වීමට හේතු විය. අවම වශයෙන් මහජන සෞඛ්‍ය අර්බුදයකට ප්‍රතිචාර දැක්වීම සඳහා අපගේ ආයතනවල ඇති සූදානමෙහි තිබෙන අඩුපාඩු මෙම කාල පරිච්ඡේදය තුළින් අනාවරණය වූ අතර අලුතින් තොරතුරු මතුවන විට දිශාව නැවත ගළපා ගැනීමට අපොහොසත් වීම ද එයට ඇතුළත් වේ.

නිශ්චිත ලෙස ම එවැනි ආකාරයේ පීඩනයකට ඔරොත්තු දීම සඳහා රාජ්‍ය ආයතන සැලසුම් කර ශක්තිමත් කළ යුතු අතර ඒ සඳහා සෑම කෙනෙකුට ම ගෞරවයෙන් ජීවත් වීම සඳහා ඇති අයිතියට සියුම් ගරුත්වයක් අවශ්‍ය කරයි. ශ්‍රී ලංකාවේ තත්ත්වය සැලකීමේ දී එවැනි ආයතන පැවතුණේ නැත. එවැනි විශාල පරිමාණයේ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් අනපේක්ෂිත දෙයක් වූ අතර හැකි කෙටිම කාලයක් තුළ හැකි හොඳම ප්‍රතිචාරය ලබා දීම සඳහා අදක්ෂ නිලධාරීන් ගුප්ත ආඥාපනත් සහ කුරිරු දේශපාලන බලය එකට එකතු කරන ලදී. ශ්‍රී ලංකාවට මහජන ආරක්ෂක ආඥාපනත අධික ලෙස භාවිතා කිරීමේ දීර්ඝ ඉතිහාසයක් තිබෙන අතර වසර ගණනාවක් පුරා හදිසි අවස්ථා විධිවිධාන යටතේ රට පාලනය වූ බැවින් කිසිදු හදිසි අවස්ථාවකට සම්බන්ධ නොවන සාමාන්‍ය රෙගුලාසි පවා මෙම ආඥාපනත යටතේ ප්‍රකාශයට පත් කරන ලදී. මේ අනුව, මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා ද යුද්ධ සහ අනෙකුත් සමාජ දේශපාලනික හදිසි අවස්ථා මෙන් සලකන ලද බැවින් එයට දැක්වූ ප්‍රතිචාර සෑම විටම කෲර බලයෙන් ක්‍රියාත්මක කරන ලද කඩිනම් ඒවා විය.

අමුතුවෙන් කිව යුතු නැති නමුත් මහජන කොමිසමේ කාර්යය මගින් තහවුරු කරන ලද පරිදි සංඛ්‍යාලේඛන අනුව පවා ශ්‍රී ලංකාව සමග සංසන්දනය කළ හැකි වෙනත් බොහෝ රටවලට වඩා මිය ගිය පුද්ගලයින් සංඛ්‍යාව අතින් ශ්‍රී ලංකාව

# කොවිඩ් වසංගතයෙන් පසුකාලීන ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා

හොඳින් කටයුතු කර ඇති නමුත් කතාව කියන්නට ජීවිතය බේරාගැනීමට හැකි වූ බොහෝ ශ්‍රී ලාංකිකයින්ට අනුව හොඳම ප්‍රතිචාරය පවා ප්‍රමාණවත් නොවීය. කෙසේ වෙතත් තමන්ගේ අසාර්ථකත්වයක් හෝ වරදක් නිසා නොව රජය විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිවල සෘජු ප්‍රතිවිපාකයක් ලෙස හුදකලා වී නිහඬව අපහාසයට ලක්වීමට සිදුවූ පුද්ගලයින් සංඛ්‍යාව සමග සංසන්දනය කිරීමේදී ශ්‍රී ලංකාව කොවිඩ් සම්බන්ධයෙන් සාර්ථකත්වයේ කතාවක් යැයි පැවසීම වඩාත් අපැහැදිලි සහ විශ්වාස කිරීමට අපහසු ප්‍රකාශයක් වේ. එම සංඛ්‍යාව ඇතැම්විට කිසිදා දැනගත නොහැකි වනු ඇත.

මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය මහජන කොමිසම විසින් පවත්වන ලද මහජන අදහස් විමසීම්වලට සහභාගී වූවන් විසින් සපයන ලද තොරතුරු මගින් අනාවරණය කරන ලද මානව හිමිකම් උල්ලංඝනය වීමේ සිදුවීම්වලට සීමා වේ. එම තොරතුරු කොවිඩ් අර්බුදය අතරතුර සිදු වූ සියලු දේ පිළිබඳ සම්පූර්ණ විස්තර නොවේ. කෙසේ වෙතත් ඒවා රටේ සෞඛ්‍ය පද්ධතිය සමග ජනතාවගේ ඇති සම්බන්ධතාවයෙහි සංකීර්ණ බව පෙන්නුම් කරන අතර මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් හේතුවෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සහ සේවා සැපයීම් වෙනස් කිරීමේ දී එය පෙර නොවූ විරූ තරම් පුළුල් වූවක් වන විට පවා ජනතාව දේශපාලන නායකයින් ඇතුළු රාජ්‍ය බලධාරීන්ගෙන් ඉල්ලා සිටින ගරුත්වය සැලකිලිමත් බව සහ පාර්ශ්වික චින්තනය එයින් පිළිබිඹු වෙයි.

එවැනි උල්ලංඝනයවීම් ඒවායෙහි බරපතලකම සැලකීමේ දී තනි තනිව පිළියම් යෙදිය හැකි ඒවා යැයි යෝජනා කිරීම ප්‍රායෝගික නොවන නමුත් මානව හිමිකම් උල්ලංඝනයවීම්වල ස්වභාවය සහ පරිමාණය සැලකීමේ දී ඒවා සිදුවූයේය යන කාරණය නොසලකා හැරිය නොහැක. එබැවින් එවැනි උල්ලංඝනයවීම් සඳහා වන ඕනෑම පිළියමක් ඒවායින් ඇති වූ තුවාලවලට අනුරූප විය යුතු අතර ම සියලුම ශ්‍රී ලාංකිකයින්ට සාමූහිකව වඩාත් ප්‍රයෝජනවත් වන දේ ඇතුළත සහ සියලු ම ශ්‍රී ලාංකිකයින්ට සුවය ලැබීම සහ ප්‍රතිසාධනය අත්කර ගැනීම සඳහා යන ගමනේ දී සාමූහිකව කළ හැකි සහ යෝග්‍ය දෙයෙහි සීමාවන් තුළ සිදුවිය යුතු ය.

## නිර්දේශ

- විමර්ශනය කිරීම් කොවිඩ් වසංගතයට ප්‍රතිචාර දැක්වීම සඳහා රජය අනුගමනය කළ විවිධ ප්‍රතිපත්ති හේතුවෙන් මානව හිමිකම් උල්ලංඝනය වූ ආකාරය හඳුනා ගැනීම සඳහා එම වසංගතය පැවති කාලය සිදු වූ මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වල පරිමාණයට අනුරූප වන විෂය පථයක් සහිත යෝග්‍ය සහ අන්තර්කරණය වූ කරුණු සෙවීමේ යාන්ත්‍රණයක් රජය විසින් ස්ථාපනය කළ යුතු ය. එවැනි යාන්ත්‍රණයක් දේශපාලනික වශයෙන් ස්වාධීන අපක්ෂපාතී සහ ප්‍රමාණවත් සම්පත් සහිත යාන්ත්‍රණයක් විය යුතු අතර එය ස්වකීය මෙහෙවර ඉටු කිරීමට අවශ්‍ය බහුවිෂයයික විශේෂඥතාලින් සමන්විත විය යුතු ය.

- පිළිගැනීම් රජය කරුණු සෙවීමේ යාන්ත්‍රණය මගින් සොයාගන්නා ලද කරුණු ප්‍රසිද්ධියේ හෙළි කළ යුතු අතර එම සොයාගැනීම්වලින් හෙළිදරව් කරන ලද මානව හිමිකම් උල්ලංඝනය කිරීම් තවදුරටත් වසන් නොකර සද්භාවයෙන් යුතුව පිළිගනිමින් එවැනි උල්ලංඝනයවීම් සිදුවීමට තුඩු දුන් නීති ප්‍රතිපත්ති සහ ආයතනික විධිවිධාන වල (සම්පත් කළමනාකරණය කිරීමෙහි සහ සංවිධානය කිරීමෙහි ඇතුළුව) ඇති අඩුපාඩු  පැහැදිලි කළ යුතු ය.

- සමාව ගැනීම් කොවිඩ් අර්බුදය තුළ දී සිදුවූ මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිගැනීමේ ඕනෑම ක්‍රියාවලියක් පුළුල් ලෙස පැහැදිලිව මහජනතාවගෙ න් කරන සමාව ඉල්ලීමකින් අවසන් විය යුතු ය. අයිතිවාසිකම් උල්ලංඝනය කරන ප්‍රතිපත්තිවල වින්දිතයන්/ඒවායින් නොනැසී සටින්නන් නිල අනුස්මරණ කාල පරිච්ඡේදයක් ප්‍රකාශයට පත් කිරීම හරහා අනුස්මරණය කළ යුතු අතර එම කාලය තුළ දී එකී ප්‍රතිපත්තිවලට හේතු සහ ඒවායෙහි බලපෑම් මතක තබා ගැනීමට සහ ඒවා ආවර්ජනය කිරීමටත් ශ්‍රී ලංකා සමාජය එම අත්දැකීම්වලින් සුවය ලබා ඉදිරියට යන්නේ කෙසේද යන්න පිළිබඳවත් රජය මහජනතාවට මග පෙන්විය යුතු ය.

කොවිඩ් වසංගතයෙන් පසුකාලීන

# ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා

- නැවත සිදු නොවන බව සහතික කිරීම් කොවිඩ් වසංගත කාලය තුළ සිදුවූ මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිගැනීමේ සහ ඒ වෙනුවෙන් සමාව ඉල්ලා සිටීමේ ක්‍රියාවලියේ දී රජය අනාගත මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක දී එම උල්ලංඝනයවීම් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිසංස්කරණ මොනවාද යන්න සැකෙවින් දැක්විය යුතු අතර ඒවා අනුගමනය කරනු ලබන බව සහතික කිරීම සඳහා යොදා ගත හැකි නිශ්චිත මැනිය හැකි ප්‍රතිඵල මොනවාද යන්න කාලරාමු සහිතව ඉදිරිපත් කළ යුතුය.

- නිරීක්ෂණය කිරීම සහ ඇගයීම මහජනතාවගෙන් මූලික වශයෙන් සමාව ඉල්ලා සිටීමෙන් පසුව රජය අනුස්මරණ කාලපරිච්ඡේදයේ ඉදිරි සැමරුම් එම උල්ලලංඝනයවීම් නැවත ඇති නොවන බවට මහජනතාවට ලබා දුන් පොරොන්දු සාක්ෂාත් කර ගැනීමේ දී ලබා ඇති ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට ඇගයීමට සහ මහජනතාවට වාර්තා කිරීමට අවස්ථාවක් ලෙස යොදා ගන්නා බව සහතික කළ යුතු ය.

- රජයේ අපක්ෂපාතී වගකීම සහතික කිරීම කොවිඩ් වසංගත කාලය තුළ සිදුවූ මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිගැනීමේ සහ ඒවාට පිළියම් යෙදීමේ ඕනෑම ක්‍රියාවලියක් දේශපාලනික වශයෙන් මධ්‍යස්ථ විය යුතු අතර අර්බුදය පැවති කාලය තුළ දී හෝ එයට ප්‍රතිකර්ම යෙදීමේ ක්‍රියාවලිය අතරතුර දී බලයේ සිටින දේශපාලන පක්ෂ සහ ඒවායේ නායකයින්ගේ අනන්‍යතාවය කුමක් වුවත් එය රජය ලෙස රජයෙහි ම වගකීම භාර ගැනීම කේන්ද්‍රකර ගත් ක්‍රියාවලියක් විය යුතු ය.

## අනාගත මහජන හදිසි අවස්ථා සඳහා සූදානම් වීම

කලින් සඳහන් කළ පරිදි මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා නැවත ඇති වීමට ඉඩ ඇති අතර කොවිඩ් වසංගතයේ අත්දැකීම මානව හිමිකම් උල්ලංඝනයවීම්වලට තුඩු දුන් සමබර නොවූ ප්‍රතිචාරවලට හේතු වූ සෞඛ්‍ය ප්‍රතිපත්තියෙහි සහ ආයතනික විධිවිධානවල ඇති අඩුපාඩු නිරාවරණය කළ ඉගෙනුම් අවස්ථාවක් ලෙස සැලකිය යුතු ය. ඒ අනුව අනාගත මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් සඳහා සූදානම් වීමක් ලෙස ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාදායක සහ ආයතනික රාමු ප්‍රතිසංස්කරණය කිරීම ඉතා හදිසි එනම් තවත් වසංගතයක් සිදුවීමට පෙර ක්‍රියාත්මක කළ යුතු අවශ්‍යතාවයක් වේ.

මහජන කොමිසමේ ක්‍රියාමාර්ගය හරහා හදිසි ප්‍රතිසංස්කරණ අවශ්‍ය කරන විශේෂ අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර හතරක් හඳුනාගෙන තිබේ ඒවා නම්:

- කවර හෝ අනාගත හදිසි ප්‍රතිචාරයක් අන්තර්කරණය වූ සහ සහභාගීත්ව ප්‍රතිචාරයක් වන බව සහතික කිරීම.

- එවැනි ප්‍රතිචාරවල විද්‍යාත්මක නිරවද්‍යතාවය, අවශ්‍යතාවය සහ යෝග්‍යතාවය සහතික කිරීම.

- රජය විසින් සිදු කරන සීමාව ඉක්මවීම්වලට එරෙහිව අධිකරණමය ආරක්ෂණ සහතික කිරීම සහ ඒවාට අදාළව.

- ඊළඟ හදිසි අවස්ථාවක් ඇතිවීමට පෙර හැකි විගස මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා සඳහා පැහැදිලි ව්‍යවස්ථාදායක රාමුවක් ස්ථාපනය කිරීම.

සියලු ම හදිසි අවස්ථා පෙර සූදානම් ප්‍රතිසංස්කරණවල ප්‍රධාන තේමාව මගින් අනාගත මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක දී ක්‍රියාත්මක කිරීම සඳහා වන පාලන ව්‍යුහය සහ සම්මත ප්‍රමිතීන් නියම කරන ශක්තිමත් ආයතනික විධිවිධානවල අවශ්‍යතාවය පෙන්වා දෙයි.

කොවිඩ් වසංගතයෙන් පසුකාලීන

# ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා

## මහජන හදිසි අවස්ථා සඳහා පැහැදිලි ව්‍යවස්ථාදායක රාමුවක් ස්ථාපනය කිරීම

අනාගත මහජන සෞඛ්‍ය හදිසි තත්ත්වයක් ඇතිවූ අවස්ථාවක දී පැහැදිලි පාලන ව්‍යුහයක් තිබීම අවශ්‍ය වේ. කොවිඩ් වසංගතය ශ්‍රී ලංකාව තුළ සම්පූර්ණයෙන් ම පැතිරී ගිය අවස්ථාව වන විට පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබූ බැවින් වසංගතය පාලනය කිරීම යුධහමුදාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් **'කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය'** සහ අනෙකුත් ජනාධිපති කාර්ය සාධක බලකායන් වැනි තාවකාලික යාන්ත්‍රණ හරහා සිදු කරන ලදී. දේශපාලන හමුදා සහ වෛද්‍ය යන අංශවල නායකයින් කැමති වූ ප්‍රවේශයන් අතර ගැටුම් සහ වෙනස්කම් වාර්තා වූ බැවින් (මෙන්ම කටකතා පැතිර ගිය බැවින්) එය මහජනතාව අතර ව්‍යාකූලත්වයක් සහ අවිනිශ්චිතතාවයක් ඇතිවීමට හේතු විය. එවැනි ආයතන විසින් අනුගමනය කරන ලද බොහෝ ක්‍රියාමාර්ග විධිමත් නීතිමය අර්ථයෙන් මෙන්ම සදාචාරාත්මක නීත්‍යානුකූලභාවයේ දෘෂ්ටි කෝණයෙන් ද පරීක්ෂාවට යටත් විය හැකි ඒවා වන නමුත් එම කාලය තුළ සෞඛ්‍ය හදිසි නීති නොතිබූ නිසා ඒවා ක්‍රියාත්මක කිරීමට හැකි විය. එහෙයින් අනාගත අර්බුදවලදී එවැනි උල්ලංඝනයවීම් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා හැකි විගස මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක දී පැවතිය යුතු පාලන ව්‍යුහය ගෙනහැර දක්වන අදාළ ව්‍යවස්ථාදායක රාමුව බලාත්මක කිරීම අතිශය වැදගත් වේ.

## නිර්දේශ

- මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා නීතිය බලාත්මක කිරීම් එවැනි හදිසි අවස්ථාවක දී තීරණ ගැනීමේ අවසාන වගකීම දේශපාලනිකව වගකිව යුත්තන් වන තේරී පත් වූ නායකයින් වෙත පැවරී ඇති බව සහතික කරමින්, පැවතිය යුතු ආයතනික වැඩපිළිවෙළ සම්බන්ධයෙන් විධිවිධාන සැලසිය යුතු ය. මෙය සමස්තයක් ලෙස අමාත්‍ය මණ්ඩලය හෝ හදිසි තත්ත්වය පරිණාමය වන විට එහි සංයුතිය තීරණය කළ යුතු සහ වෙනස් කළ යුතු ආකාරය සඳහා විධිවිධාන සහිත කැබිනට් මණ්ඩලයේ උප කොටසක් විය හැකිය.

- විද්‍යාත්මක විශේෂඥතාවය සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය අන්තර්ගත කිරීම දේශපාලන නායකත්වය අතිශය වැදගත් වන නමුත් එයට ඒ සඳහාම වෙන් වූ සහායක ආයතන දෙකක ස්ථිර සහාය තිබිය යුතු වේ: ඉන් එකක් තීරණ ගැනීම සපයා ගත හැකි හොඳම සාක්ෂි මත පදනම් කර ගැනීම සඳහා වෛද්‍ය සහ විද්‍යාත්මක විශේෂඥයින්ගෙන් සමන්විත විය යුතු අතර අනෙක බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන් සහ සුළුතර කණ්ඩායම් සමග අඛණ්ඩව සම්බන්ධ වී ඔවුන්ගේ විවිධ දෘෂ්ටිකෝණයන් විශේෂයෙන් ම අවදානමට ලක්විය හැකි ජනගහනයෙන් ලැබෙන දෘෂ්ටිකෝණයන් දේශපාලන නායකත්වයට සන්නිවේදනය කර ඒවා යෝග්‍ය පරිදි ඔවුන්ගේ තීරණ ගැනීමේ දී ඇතුළත් කර ගන්නා බව සහතික කිරීම සඳහා වන කණ්ඩායමක් විය යුතු ය. මෙම ත්‍රෛපාර්ශ්වික ව්‍යුහය මහජන විශ්වාසය සහ අනුකූලතාවය වැඩි දියුණු කරනු ඇති අතර ම හදිසි අවස්ථා ප්‍රතිචාරය විද්‍යාත්මකව යෝග්‍ය සහ සමාජයීය වශයෙන් සාධාරණ බව සහතික කරනු ඇත.

- මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා නීති වෙනත් ඕනෑම හදිසි තත්වයකට අදාළ නීතිවලට වඩා වෙනස් ලෙස සලකන බව සහතික කිරීම් මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා පාලනය කෙරෙන ඕනෑම නීතියක් වසංගත සහ/හෝ වෙනත් මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන මහජන ආරක්ෂක ආඥා පනත වැනි සාමාන්‍ය හදිසි නීති ප්‍රමාණවත් නොවන්නේය සහ ඇත්ත වශයෙන්ම යෝග්‍ය නොවන්නේය යන්න පිළිගැනීම පදනම් කරගෙන සකස් කළ යුතු ය. එහෙයින් මහජන සෞඛ්‍ය හදිසි තත්ත්වයන් වෙනත් ඕනෑම ආකාරයක හදිසි තත්ත්වයන්ගෙන් වෙනස් වන්නේ යැයි සැලකිය යුතු අතර එවැනි සිදුවීමක දී යම් නිශ්චිත මහජන සෞඛ්‍ය හදිසි නීතියක් පමණක් අදාළ විය යුතු ය. මහජන සෞඛ්‍ය හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ දී සහ සාධාරණීකරණය කිරීමේ දී අනුගමනය කළ යුතු මූලික නිර්ණායක සහ අදාළ කාර්ය පටිපාටිය (අදාළ වෛද්‍ය/සෞඛ්‍ය විශේෂඥයින්ගේ නිර්දේශයන්ට යටත්

වන) කුමක්ද යන්න එවැනි නීතියක් මගින් නිර්වචනය කළ යුතු අතර, එවැනි නීතියක් බලාත්මක කරන තෙක් එම කාලය තුළ අවම වශයෙන් පහත සඳහන් ආයතන සහ සම්මත ප්‍රමිතීන් ක්‍රියාත්මක විය යුතු ය.

- මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා නීතිය මගින් මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක සම්පූර්ණ ජීවන චක්‍රය ම ආවරණය කරන බව සහතික කිරීම මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා ආමන්ත්‍රණය කිරීම යන්නට වැළැක්වීම පෙර සූදානම ප්‍රතිචාර දැක්වීම සහ යථා තත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම ඇතුළත් වන අතර ඕනෑම මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා නීතියකට මෙම අංශ හතර ම ඇතුළත් විය යුතු යි විශේෂයෙන් ම ඕනෑම මහජන සෞඛ්‍ය හදිසි තත්ත්වයකින් පසු **'යථා තත්ත්වයට පත්වීමේ'** අවධියේ දී සියලු ම රජයේ සේවකයන් ඔවුන්ගේ ක්‍රියාවන්ට නීත්‍යානුකූලව වගකිව යුතු වන බව සහතික කිරීම එවැනි හදිසි අවස්ථාවක දී පුද්ගලික ක්‍රියාකාරීන් විසින් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වැළැක්වීම සඳහා අත්‍යවශ්‍ය වේ.

## අනාගත හදිසි අවස්ථා ක්‍රියාමාර්ග අනතර්කරණය වූ සහ සහභාගීත්ව ක්‍රියාමාර්ග බව සහතික කිරීම

දේශපාලන නායකත්වය විද්‍යාත්මක විශේෂඥතාව සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතුළත් ත්‍රෛපාර්ශ්වික ආයතනික වැඩපිළිවෙළක අවශ්‍යතාවය ඉහතින් සඳහන් කරන ලදී. සෞඛ්‍ය හදිසි තත්ත්වයන් සඳහා පෙරසූදානම් වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා වන සියලු ක්‍රියාමාර්ග අන්තර්කරණය වූ සහ සාධාරණ ඒවා බව සහතික කිරීම මානව හිමිකම් උල්ලංඝනයවීම් සිදුවීමට හේතු වන ප්‍රතිපත්ති ඉක්මවායාම් වැළැක්වීමේ සඳහා අත්‍යාවශ්‍ය වේ. වැළැක්වීම, පෙර සූදානම, ප්‍රතිචාර දැක්වීම සහ යථා තත්ත්වයට පත් කිරීම යන සියලු අදියර පුරා අවාසි සහගත සහ අසමානුපාතික ලෙස බලපෑමට ලක් වූ කණ්ඩායම් ප්‍රගාමී සහ ක්‍රමානුකූල ලෙස ඇතුළත් කර ගැනීම සහතික කිරීම සඳහා ම වෙන්වූ ආයතනයක් පිහිටුවීම මගින් මෙය සාක්ෂාත් කරගත හැකියි එවැනි ආයතනයක් අදාළ පාර්ශ්වකරුවන් කලින් හඳුනා ගැනීමට සහ සම්බන්ධ කර ගැනීමට සහභාගීත්වයට ඇති බාධක ඉවත් කිරීමට සහ සන්නිවේදනය සියලු දෙනාට ප්‍රවේශ විය හැකි බව සහතික කිරීමට උපකාරී වන අතර එය අර්බුද අතරතුර දී අවදානමට ලක්විය හැකි ජනගහනය කොන් කරනු ලැබීමට ලක්වීමෙන් ආරක්ෂා කරයි. එවැනි ආයතනයක් දේශපාලන හා පරිපාලන බලපෑම්වලින් ස්වාධීනවීම විශ්වාසය සහ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන අතර පාර්ශ්වකරුවන් විසින් ලබා දෙන ආදානයන් මහජනතාව සමග සෘජුව ම බෙදා ගැනීමට සහ ක්‍රියාමාර්ගවල අසමානුපාතික හෝ වෙනත් ආකාරයකින් අසාධාරණ බලපෑම් අධිකරණ ආයතන වෙත යොමු කිරීම සඳහා විධිමත් බලතල තිබීම මගින් වගවීම වැඩි දියුණු කරනු ඇත.

## නිර්දේශ

- සම්බන්ධතාවය ස්ථාපනය කිරීම වැළැක්වීම පෙර සූදානම ප්‍රතිචාර දැක්වීම සහ යථා තත්ත්වයට පත්කිරීම යන සියලු ක්‍රියාමාර්ග සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සියලු ම ශ්‍රී ලාංකිකයන්ගේ විශේෂයෙන් ම අවාසි සහගත තත්ත්වයන්හි සිටින සහ අසමානුපාතිකව බලපෑමට ලක් වූ කණ්ඩායම් වල සහ ජනතාවගේ සහභාගීත්වය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් සහ අදාළ බහුවිධ විශේෂඥතාවයක් සහිත පුද්ගලයන්ගෙන් සමන්විත ආයතනයක් සැලසුම් කර ස්ථාපනය කිරීම;

- අන්තර්කරණය කරන බව සහතික කිරීම් එම ආයතනයට අවාසි සහගත සහ අසමානුපාතිකව බලපෑමට ලක් වූ කණ්ඩායම් සහ ජනතාව කාණ්ඩ සංවිධාන සහ පුද්ගලයින් ලෙස හඳුනාගෙන විධිමත් ක්‍රියාවලීන් සකස් කිරීමේ කාර්යය පැවරිය යුතුය. හදිසි අවස්ථාවට පෙර හෝ හදිසි අවස්ථාවක් අතරතුර දී හෝ එවැනි කණ්ඩායමක් හෝ පුද්ගලයින් මගහැරීමක් සිදු නොවන බව සහතික කිරීම සඳහා එවැනි ක්‍රියාමාර්ගවලට හදිසි අවස්ථාවට පෙර ක්‍රියාමාර්ග සහ හදිසි අවස්ථාවෙන් පසු ක්‍රියාමාර්ග යන දෙක ම ඇතුළත් විය යුතු ය. හදිසි අවස්ථාවේ පූර්ව අවධියේ දී (එනම් පෙරසූදානම් වීමේ) එම ආයතනය තමන්ගේ ම හඳුනාගැනීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතු අතර ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වී ආයතනයේ

කාර්යයට සම්බන්ධ වන ලෙස සෑම කණ්ඩායමකින්ම සහ පුද්ගලයෙකුගෙන් ම පොදු ඉල්ලීමක් කළ යුතු ය.

- ප්‍රවේශය සහතික කිරීම ආයතනය සහ ආයතනය විසින් හඳුනා ගනු ලබන පාර්ශ්වකරුවන් අතර පිළිවෙලින් එක් එක් පාර්ශ්වකාර කාණ්ඩයට යෝග්‍ය වන ආකාරවලින් ප්‍රමාණවත් සන්නිවේදන ක්‍රම පවතින බව සහතික කළ යුතුයි මහජන සෞඛ්‍ය හදිසි තත්ත්වයක් සඳහා පෙරසූදානම් වීමේ දී ආයතනය සහභාගීත්වය සහ සන්නිවේදනය සඳහා එක් එක් පාර්ශ්වකරුවන්ගේ කාණ්ඩයට ඇති බාධක ඉවත් කිරීම සඳහා කටයුතු කළ යුතු අතර එමගින් සියලු දෙනාට පොදු ප්‍රවේශය සහතික කළ යුතු ය. බැලූ බැල්මට කවර හෝ කණ්ඩායමකට හෝ පුද්ගලයින්ට ආයතනයට ප්‍රවේශ වීමට බාධා කරන ඕනෑම හදිසි ප්‍රතිචාර ක්‍රියාමාර්ගයක් නීති විරෝධී ලෙස මූලික වශයෙන් සැලකිය යුතු ය.

- ස්වාධීනත්වය සහතික කිරීම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයට පහසුකම් සැලසීමේ කාර්යය පැවරී ඇති ආයතනය ස්වාධීන විය යුතු අතර දේශපාලන නායකත්වයෙන් මෙන්ම රාජ්‍ය පරිපාලනයෙන් ද වෙන් විය යුතු ය. ආයතනය වෙත පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන සෑම තොරතුරක් ම ප්‍රසිද්ධ කිරීමට සහ එම තොරතුරු සුදුසු අධිකරණ ආයතන වෙත යොමු කිරීමට ආයතනයට බලය පැවරිය යුතුය.

- සහයෝගීතාවයන් ගවේෂණය කිරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වැනි ආයතන සමග සහයෝග යෙන් කටයුතු කිරීම මගින් ආයතනයේ බලතල සහ බලපෑම ශක්තිමත් වන අතර හදිසි අවස්ථා පාලනය අයිතිවාසිකම් සහ සන්දර්භ-විශේෂිත ප්‍රවේශයන් යන දෙකම මත පදනම් වී ඇති බව සහතික කරයි.

- සම්පත් වෙන් කර දීම අවාසි සහගත කණ්ඩායම් හඳුනා ගැනීමේ දී ඔවුන් සමග සන්නිවේදනය කිරීමේ දී සහ ඔවුන්ව අන්තර්කරණය කිරීමේ දී අවශ්‍ය සම්පත් තිබීම මගින් ආයතනයේ කාර්යක්ෂමතාවය තීරණය වන බැවින් මෙහි යෝජනා කර ඇති ආකාරයේ ආයතනයකට ප්‍රමාණවත් සම්පත් අත්‍යවශ්‍ය වේ.

## ක්‍රියාමාර්ගවල විද්‍යාත්මක නිරවද්‍යතාවය - අවශ්‍යතාවය සහ යෝග්‍යතාවය සහතික කිරීම

වෛද්‍ය වසංගත රෝග විද්‍යාත්මක සහ මහජන සෞඛ්‍ය විශේෂඥයින්ගෙන් අඛණ්ඩව ආදානයන් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන යාන්ත්‍රණ ඇතුළත් කිරීම මගින් රජයට පරිණාමය වන තර්ජනවලට ඉක්මනින් අනුවර්තනය වීමට විනිවිදභාවය තහවුරු කිරීමට සහ මහජන අනුකූලතාවය ප්‍රවර්ධනය කිරීමට හැකි වේ. සම්මුතිය පදනම් කර ගත් විශේෂඥ උපදෙස් පදනම් කර ගෙන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සකස් කළ යුතු බවට නියම කිරීම රජය සීමා ඉක්මවා කටයුතු කිරීම හේතුවෙන් සිදුවන මානව හිමිකම් උල්ලංඝනයවීම් වළක්වා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වේ. බලහත්කාරයෙන් ආදාහනය කිරීම පිළිබඳ ශ්‍රී ලාංකික අත්දැකීම ඒ සඳහා වන ප්‍රබල උදාහරණයක් වන අතර ජාතික දේශසීමා නැවත විවෘත කළ යුත්තේ කවදාද යන්න තීරණය කිරීම සහ එන්නත් කිරීමේදී කාට ප්‍රමුඛත්වය දිය යුතුද යන්න වැනි කොවිඩ් ප්‍රතිපත්තියට අදාළ අනෙකුත් ක්ෂේත්‍රවල දී ද විශේෂඥ උපදෙස් නොසලකා හැරීම නිසා මහජනතාවගේ ඇතැම් කොටස්වලට අහිතකර ප්‍රතිවිපාක ඇති වූ බව පෙනෙන්නට තිබුණි. ඒ අතරම ඉහත සඳහන් කළ උදාහරණවල දී පවා විශේෂඥ මතය ද වෙනස් වූ බව පෙනෙන්නට තිබූ අතර ඇතැම් විශේෂඥයන් බලහත්කාරයෙන් ආදාහනය කිරීම වැනි ඇතැම් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සාධාරණීකරණය කිරීම සඳහා ඔවුන්ගේ තත්ත්වය අයුතු ලෙස යොදා ගත් නමුත් අවසානයේ දී ඔවුන් එයින් අපකීර්තියට පත් වූහ. ඒ අනුව රජය මහජන සෞඛ්‍ය හදිසි තත්ත්වයකට ප්‍රතිචාර දැක්වීමේ දී අවශ්‍ය කරන විශේෂඥ මග පෙන්වීම එම කාර්යය සඳහා විශේෂයෙන් ස්ථාපනය කර ඇති ආයතනයකින් ලබා ගන්නා බව සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. එම වගකීම පැවරී ඇති විශේෂඥයින් ඔවුන් සපයන මතවලට තනි තනිව සහ සාමූහිකව වගකිව යුතු අතර විශේෂයෙන් ම එම අදහස් ඒවා ප්‍රකාශ කරන ලද අවස්ථාවේ පැවති විද්‍යාත්මක දැනුමට පටහැනි බව පෙනී ගියහොත් ඔවුන් ඒ සම්බන්ධයෙන් වගකිව යුතු ය.

## නිර්දේශ

- විශේෂඥ මණ්ඩලය පිහිටුවීමේ කාර්ය පටිපාටිය සඳහා විධිවිධාන සැලසීම් මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා නීතිය මගින් මහජන සෞඛ්‍ය හදිසි තත්ත්වයක දී උපදෙස් ලබා ගැනීම පිණිස විශේෂඥ උපදේශක මණ්ඩලයක් පිහිටුවීමේ කාර්ය පටිපාටිය සඳහා විධිවිධාන සැලසිය යුතු යි එම මණ්ඩලයට සාමාජිකයන් පත්කිරීමේ දී ඔවුන්ගේ අපේක්ෂකත්වයට පෙර සුදුසු අධිකාරියක් විසින් ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලබන්නේ නම් ඔවුන්ගේ ක්ෂේත්‍රයේ සිටින සමානයින් විසින් උදාහරණයක් ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔවුන්ගේ අදාළ වෘත්තීය සංගමයේ හෝ විද්‍යාලයේ පාලක මණ්ඩලය වැනි සමානයින් විසින් ඔවුන්ව තෝරා පත් කළ යුතු වීම ඉතාමත් යෝග්‍ය වේ. එම මණ්ඩලයේ විශාලත්වය සහ මණ්ඩලය තුළ තිබෙන විශේෂඥතාවයේ විවිධත්වය එවැනි විශේෂඥයින් ලබා ගැනීමේ හැකියාව මත රඳා පවතියි. කෙසේ වෙතත් යෝජිත නීතිය මගින් මෙම සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීමට ප්‍රමාණවත් තරම් නම්‍යශීලී කාර්ය පටිපාටියක් නියම කළ යුතු අතර අදාළ විශේෂඥතාවයේ ප්‍රමාණවත් එකඟත්වයක් පිළිබිඹු කිරීම පිණිස එය ප්‍රමාණවත් පරිදි සහ විවිධත්වයක් සහිත විශේෂඥයන්ගෙන් සමන්විත වන බව සහතික කළ යුතුය.

- සියලු ම සෞඛ්‍ය හදිසි ක්‍රියාමාර්ග විශේෂඥ මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන හෝ එයට යොමු කරනු ලබන ඒවා බවට සහතික කිරීම් සෞඛ්‍ය හදිසි අවස්ථා ක්‍රියාමාර්ග විවිධ සලකා බැලීම් තුළින් නිරන්තරයෙන් නීත්‍යානුකූලභාවය ලබා ගනියි. කෙසේ වෙතත් අවම වශයෙන් එවැනි ක්‍රියාමාර්ගවලින් මානව හිමිකම් සීමා කරන නමුත් වෛද්‍ය හේතූන් මත ඒවා අවශ්‍ය යැයි කියනු ලබන විට හෝ එවැනි අවශ්‍යතාවයක් ඒ සඳහා විශේෂයෙන් පිහිටුවා ඇති විශේෂඥ මණ්ඩලය විසින් තහවුරු කළ යුතු ය. හදිසි ක්‍රියාමාර්ගයක නීත්‍යානුකූලභාවය තීරණය කිරීමේදී විද්‍යාව පමණක් සලකා බැලිය නොහැකි වුවද එය යම් අයිතිවාසිකමක් සීමා කරන ක්‍රියාමාර්ගයක් ගැනීමේදී සලකා බැලිය යුතු අවම නිර්ණායකය විය යුතුය.

- මහජන සෞඛ්‍ය පරිපාලකයන් සහ විශේෂඥයන් අතර සමබරතාවයක් සහතික කිරීම හදිසි අවස්ථා ප්‍රතිචාර ක්‍රියාත්මක කිරීම අතින් ඵලදායී වන බවත් විද්‍යාත්මක අතින් යෝග්‍ය වන බවත් සහතික කිරීම පිණිස ඒ සඳහා ම වෙන්වූ වෛද්‍ය උපදේශක ආයතනයක විශේෂඥ අදහස් මහජන සෞඛ්‍ය පරිපාලකයින්ගේ බල අධිකාරිය සමග සමබර කිරීම අත්‍යවශ්‍ය වේ. කාලෝචිත හා සම්බන්ධීකරණය සහිත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පරිපාලකයින් වගකිව යුතු වන අතර ඔවුන්ගේ තීරණ නවතම වෛද්‍ය සාක්ෂි සහ විශේෂඥ විශ්ලේෂණ මගින් මගපෙන්වන ලද ඒවා යුතු ය. මෙම සමබරතාවය සීමාවන් ඉක්මවා යාම වැළැක්වීමටත්, වගවීම සහතික කිරීමටත්, ගනු ලබන ක්‍රියාමාර්ග කාර්යක්ෂම ඒවා පමණක් නොව වෛද්‍යමය වශයෙන් යුක්ති සහගත සහ එල්ලවන තර්ජනයට සමානුපාතික ඒවා වන බවටත් මහජන තුළ විශ්වාසය ගොඩ නැගීමට උපකාරී වෙයි.

- ස්වාධීනත්වය සහතික කිරීම් දේශපාලන අංශයට විශේෂඥ උපදෙස් ලබා දීම සඳහා පිහිටුවා ඇති ආයතනය ස්වාධීන විය යුතු අතර දේශපාලන නායකත්වයෙන් මෙන්ම රාජ්‍ය පරිපාලනයෙන් ද වෙන් විය යුතු ය. යෝග්‍ය යැයි සලකනු ලබන ඕනෑම තොරතුරක් නිසි ලෙස අර්ථ දක්වා ඇති සත්කාර ප්‍රමිතීන්ට යටත්ව ප්‍රසිද්ධ කිරීමට ආයතනයට බලය පැවරිය යුතු ය.

- සහයෝගීතාවයන් ගවේෂණය කිරීම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයට පහසුකම් සැලසීමේ කාර්යය පැවරී ඇති ආයතනය සමග සහයෝගීත්වයෙන් කටයුතු කිරීම සෞඛ්‍ය හදිසි ප්‍රතිචාරයක විද්‍යාත්මක නියෝග සහ මහජනතාවගේ සමස්ත සුභසාධනය සහ යහපැවැත්මට සාපේක්ෂව එම ප්‍රතිචාරයේ සමානුපාතිකත්වය තීරණය කරන සමාජ ආර්ථික නියෝග අතර සහයෝගීතාවයන් සහතික කළ හැකිය.

කොවිඩ් වසංගතයෙන් පසුකාලීන

# ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා

## රජය විසින් සීමාවන් ඉක්මවායාම පිළිබඳ අධිකරණමය ආරක්ෂාවන් සහතික කිරීම

මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා වලදී විධායක බලය බොහෝ විට සීඝ්‍රයෙන් පුළුල් වී ව්‍යවස්ථාපිත සීමා ඉක්මවා යාමේ අවදානමක් ඇති විට මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා අධිකරණමය ආරක්ෂණයන් තිබීම ඉතා වැදගත් වේ. හදිසි ක්‍රියාමාර්ග නීත්‍යානුකූල, සමානුපාතික සහ වෙනස් කොට සැලකීම්වලින් තොර වන බව සහතික කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය එම ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීමට සහ අවශ්‍ය විටෙක සීමා කිරීමට පැහැදිලි බලයක් රඳවා ගත යුතුය. යුක්තිය සඳහා ප්‍රවේශය පවත්වා ගැනීමෙන්, විශේෂඥයන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ ආදානයන් ඇතුළත් කිරීමට පහසුකම් සැලසීමෙන් සහ අධිකරණයට ප්‍රමාණවත් තරම් පුහුණුව සහ අවශ්‍ය සම්පත් සපයා ඇති බවත් සහතික කිරීමෙන් වගවීම තහවුරු කිරීමට සහ අර්බුදවලට ප්‍රතිචාර දක්වන මුවාවෙන් සිදුවන මූලික අයිතිවාසිකම් ඛාදනය කිරීම් වැළැක්වීමට අධිකරණ ආරක්ෂණයන් උපකාරී වෙයි.

## නිර්දේශ

- මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා නීති සම්පාදනයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විධිවිධාන සලසා ඇති මූලික අයිතිවාසිකම් බැඳීම් සමග අනුකූල වීම සඳහා සෞඛ්‍ය හදිසි අවස්ථා ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති අධිකරණ බලය පැහැදිලිව හඳුනා ගැනීම.

- මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් ආරම්භයේ දී ශ්‍රේෂ්ඨාධිකරණයට යෝග්‍ය, ප්‍රයෝජනවත් හෝ අවශ්‍ය අවස්ථාවන්හි දී සෘජුව ම හෝ වාචිකව විශේෂඥ උපදෙස් ඇතුළු අදාළ සියලු තොරතුරු ප්‍රයෝජනයට ගත හැකි වන බව සහතික කරන අතර ම පීඩාවට පත් වූ පුද්ගලයන්ට, කණ්ඩායම්වලට සහ ජනතාවට යුක්තිය වෙත බාධාවකින් තොරව ප්‍රවේශය සහතික කළ හැකි වනු පිණිස ස්වකීය කාර්ය පටිපාටි තීරණය කිරීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති නිසඟ බලය පිළිගැනීම.

- මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක දී පුද්ගලයන්ගේ සුළුතර කණ්ඩායම්වල සහ මහජනතාවගේ අයිතිවාසිකම් රජය විසින් සිදුකරන සීමා ඉක්මවායාම්වලින් ආරක්ෂා කිරීමේ දී අධිකරණයට පැවරෙන මූලික කාර්යභාරය සහ රාජකාරිය පිළිග ැනීම මගින් අධිකරණය විධායකයේ අපේක්ෂාවන්ට අනුව කටයුතු කිරීම පැහැදිලිව සීමා කිරීම.

- ඕනෑම හදිසි ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කිරීම, එහි භූගෝලීය සාධක ජනවිකාස පදනම, තාවකාලික විෂය පථය සහ අනෙකුත් කරුණු අනුව සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් සීමා කිරීමේ බලය ශේෂ්ඨාධිකරණයට පැවරීම.

- නඩු ඒකාබද්ධ කිරීම මගින් හෝ අවශ්‍ය විටෙක, විශේෂයෙන් ම අධිකරණයේ තීරණයෙහි කඩිනම්භාවය ආරවුලේ හරය වන විට එම නඩු අති විශේෂ ක්‍රියාමාර්ග හරහා පහළ අධිකරණවලට පැවරීම මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට ලැබෙන හදිසි අවස්ථා සම්බන්ධ නඩු බර අපේක්ෂා කිරීමට සහ කළමනාකරණය කිරීමට ශේෂ්ඨාධිකරණයට බලය පැවරීම.

- අධිකරණයේ තීරණය ඉල්ලා සිටීමේ දී මෙන්ම හදිසි අවස්ථා ක්‍රියාමාගර්යක් ක්‍රියාත්මක කිරීමෙන් පැන නගින ඕනෑම පැමිණිල්ලක් හෝ පෙත්සමක් විභාග කිරීමට අධිකරණයට සහාය වීමේදී ද පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයට පහසුකම් සැලසීමේ කාර්යය පැවරී ඇති ආයතනයට ඉටු කළ හැකි කාර්යභාරය නිර්වචනය කිරීම.

- මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා ක්‍රියාමාර්ග සාධාරණ හා අයිතිවාසිකම්වලට ගරු කරන ඒවා බව සහතික කිරීමේදී අධිකරණ සහතිකවීම් මගින් ඉටු කළ යුතු කාර්යභාරය සඳහා විනිසුරුවන්ගේ නීතිඥයන්ගේ සහ අනෙකුත් අදාළ ආයතනවල ධාරිතා වර්ධනය සහ පුහුණුව සඳහා ආයෝජනය කිරීම.

## කොවිඩ් වසංගතයෙන් පසුකාලීන

# ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා

### සෞඛ්‍යය සඳහා ඇති අයිතිය සමාජ ආරක්ෂණය සමග ඒකාබද්ධ කිරීම

කොවිඩ් වසංගතය වැනි හදිසි අවස්ථා වලදී එම හදිසි අවස්ථාවට ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින සම්පත් සංවිධානය කර ගැනීමේදී රජය විශාල අභියෝගවලට මුහුණ දෙයි. එම අභියෝගයේ බර දැනෙන්නේ තම දෛනික සෞඛ්‍ය සේවා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා බදු අරමුදල්වලින් සපයා දෙනු ලබන සෞඛ්‍ය සේවා මත දැඩි ලෙස විශ්වාසය තබා සිටින ජනගහනයේ දළිඳු ම කොටස්වලට ය. ශ්‍රී ලංකාවේ බදු මුදල්වලින් පවත්වාගෙන යනු ලබන සෞඛ්‍ය සේවා පද්ධතිය ඒ හා සමාන මට්ටමේ අනෙකුත් රටවලින් බොහොමයකට සාපේක්ෂව ඉහළ මටටම පවතියි. ජනතාව තම පුද්ගලික මුදලින් මුදල් ගෙවා ලබා ගන්නා සෞඛ්‍ය සේවාවන් ද ජනගහනයේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීමේ දී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. පොදු සෞඛ්‍ය සේවා පද්ධතිය පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා බැහැර කරමින් කොවිඩ් වසංගතය වැළැක්වීමේ සහ ප්‍රතිකාර කිරීමේ කාර්යයේ නායකත්වය භාර ගැනීමේ සන්දර්භය තුළ මහජන සෞඛ්‍ය සම්පත් මත ඇති වූ පීඩනය, බදු මුදලින් නඩත්තු වන සහ පුද්ගලික මුදල් ගෙවා ලබා ගන්නා සෞඛ්‍ය සේවා අතර බෙදීම් රේඛාව නැවත සකස් කළ අතර එය පුද්ගලික මුදල් ගෙවා සෞඛ්‍ය සේවා ලබා ගැනීම දැරිය නොහැකි අයට බොහෝ සෙයින් අවාසිදායක විය.

මහජන කොමිසම විසින් සොයාගන්නා ලද කරුණු වලට අනුව කොවිඩ් වසංගත කාලය තුළ නිදන්ගත රෝග සහ බෝ නොවන රෝග තිබූ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා ප්‍රමුඛත්වයක් නොලැබුණි. ශ්‍රී ලංකාවේ බදු මුදල්වලින් නඩත්තු වන සෞඛ්‍ය සේවාවේ වියදම් වලින් සැලකිය යුතු කොටසක් බෝ නොවන රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා වැය වන අතර හදිසි අවස්ථාවක් ඇතිවූ විට ඒ සඳහා සම්පත් නැවත වෙන් කිරීම නිසා බෝ නොවන රෝග තිබූ රෝගීන් ස්වභාවිකවම පීඩාවට පත්වෙති. කොවිඩ් වසංගතය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බරපතල නිදන්ගත රෝගවලින් පෙළෙන රෝගීන්ව පසෙකට දැමීම සෞඛ්‍යය සඳහා ඇති අයිතියේ විෂය පථය කොවිඩ් රෝගයට ප්‍රතිකාර කිරීම සහ වැළැක්වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කිරීම දක්වා පටු කළ අතර එමගින් කොවිඩ් නොවන රෝගීන්ගේ යහපැවැත්ම සහ ගරුත්වය අඩපණ කරන ලදී. අනෙක් අතට වසංගත කාල පරිච්ඡේදය තුළ දී ශ්‍රී ලාංකිකයන් කොවිඩ් ආශ්‍රිත සෞඛ්‍ය භාණ්ඩ හා සේවාවන් වෙත ප්‍රවේශ වූ ආකාරයෙහි පවා අසමානාත්මතාවයන් දක්නට ලැබුණි. මුඛ ආවරණවල සහ ප්‍රතිදේහජනක සහ ඡකසෘ පරීක්ෂණවල මිලෙහි සිට නිරෝධායන මධ්‍යස්ථාන සහ ලබා ගත හැකි එන්නත් වෙළඳ නාම දක්වා වූ දේ බොහෝ ශ්‍රී ලාංකිකයන්ට වඩාත් පුළුල් ලෙස බැලීමේ දී ඔවුන්ගේ සමාජ තත්ත්වය මත නැතහොත් ඔවුන්ගේ ගෙවීමේ හැකියාව මත විවිධ ප්‍රමිතීන්ගෙන් ලැබුණි.

ඒ අනුව, මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් මගින් පෙර පැවති සමාජ අසමානාත්මතාවයන් වඩාත් කැපී පෙනෙන තත්ත්වයකට ඉස්මතු කළ බව පැහැදිලි යී එබැවින් අනාගත මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා සඳහා සූදානම් වීම යන්නට අර්බුදයකදී ජනගහනයේ දිළිඳු ම කොටස් සඳහා හැකි තරම් සාධාරණ ප්‍රතිඵල ලබා දෙනු පිණිස පවතින විෂමතා අවබෝධ කර ගෙන සැලසුම් කිරීම ඇතුළත් වේ. මේ වන විට දැඩි ප්‍රතිසංස්කරණයකට භාජනය කරන බවට විවේචනයට ලක්වන ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ පද්ධතියට මෙම සමබරතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට ඇත. ප්‍රධාන ම අවශ්‍යතාවයක් වන්නේ, දැනට සිදුකරන පුද්ගලයන් ඉලක්කකර මුදල් ලබා දීමේ ක්‍රමය වෙනුවට ජාතික සෞඛ්‍ය වියදම රටේ සමස්ත සමාජ ආරක්ෂණ උපාය මාර්ගයෙහි අනිවාර්ය අංගයක් ලෙස සලකනු ලබන වඩාත් පරිපූර්ණ වූ ප්‍රවේශයකට මාරුවීම කෙරෙහි අවධානය යොමු කිරීම යි. මෙම සාකල්‍ය ප්‍රවේශයෙහි කොටසක් ලෙස සමාජ ආරක්ෂණ පද්ධතිය විසින් රටේ සෞඛ්‍ය වියදම් අවශ්‍යතා සහ එම වියදම්වල අදාළ මූලාශ්‍ර සහ සංයුතිය නිතිපතා නිරීක්ෂණය කළ යුතුය. විශේෂයෙන් ම එම වියදම් රාජ්‍ය-පෞද්ගලික අංශ අතර බෙදී යන්නේ කෙසේද සහ කුමන ක්ෂේත්‍රවල ප්‍රතිකාර සඳහාද යන්නත්, හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක දී බදු මුදල් වලින් නඩත්තු වන සෞඛ්‍ය සේවා මත පමණක් රඳා පවතින දිළිඳු රෝගීන්ට ඇතිවන බලපෑම කළමනාකරණය කරන ආකාරයෙන් සම්පත් නැවත වෙන් කර දීම සඳහා මෙම තොරතුරු භාවිතා කරන්නේ කෙසේද යන්නත් පරීක්ෂා කළ යුතු ය. මූලික කරුණක් ලෙස, මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් මගින් පවතින සම්පත් නැවත වෙන්

කොවිඩ් වසංගතයෙන් පසුකාලීන

# ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා

කිරීදීමේ/සංවිධානය කිරීමේ අවශ්‍යතාවය ඇති කරන සෑම අවස්ථාවක දී ම ඉතා තීරණාත්මක සෞඛ්‍ය සේවා අවශ්‍ය වන කිසිදු රෝගියෙකුට හැකිතාක් දුරට එවැනි සේවාවන් ලබා දීම ප්‍රතික්ෂේප නොකරන බවටත්, දැනට සපයා දෙනු ලබන සේවා සහ/හෝ සත්කාරවල ප්‍රමිතීන් හි කවර හෝ වෙනස් සිදු කරන්නේ නම් එය එම ප්‍රතිපත්ති මගින් බලපෑමට ලක් වූ සියලුම රෝගීන්ට විධිමත් ලෙස සන්නිවේදනය කර නිල ප්‍රතිපත්තියක් මගින් පමණක් සිදු කරන බවටත් සහතික වන ආකාරයට රජය කටයුතු කළ යුතුය.

## නිර්දේශ

- ඩිජිටල්කරණය කරන ලද ජාතික සමාජ ආරක්ෂණ පද්ධතියක් සකස් කිරීම සඳහා දැනට දරමින් තිබෙන ප්‍රයත්නයන්ට සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධති ඩිජිටල්කරණය කර අන්තර්ගත කිරීම් ශක්තිමත් සමාජ ආරක්ෂණ පද්ධතියක් සපයා දීමේ දී ඩිජිටල්කරණයෙහි අදාළත්වය රජය දැනටමත් හඳුනාගෙන ඇති බැවින්, සෞඛ්‍ය සේවාවේ ප්‍රාථමික මට්ටමේ සිට ඉහළට තිබෙන සෞඛ්‍ය තොරතුරු පද්ධති මෙම ක්‍රියාවලියට ඒකාබද්ධ කළ යුතු යි එවිට අදාළ සෞඛ්‍ය තොරතුරු (විවිධ රෝග පැතිරීම, ඒවායේ කලාපීය විසංයෝජනය, වෛද්‍ය සැපයුම් සහ උපකරණ සඳහා ඇති ඉල්ලුම, වියදම් පිළිබඳ නිවැරදි ඇස්තමේන්තු සහ ප්‍රසම්පාදන පුරෝකථන ආදිය) ජාතික සමාජ ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලියේ අනිවාර්ය කොටසක් වේ.

- සමාජ ආරක්ෂණ පද්ධතිය විසින් සමාජ වියදම්වල අංගයක් ලෙස මහජන සෞඛ්‍ය වියදම් නිරීක්ෂණය කරන බව විශේෂයෙන් ම බෝ නොවන රෝග/නිදන්ගත රෝග සහිත රෝගීන්ට මහජන බදු මුදල්වලින් අරමුදල් සපයනු ලබන සෞඛ්‍ය සේවා සැපයීමේ පිරිවැය නිරීක්ෂණය කරන බව සහතික කිරීම.

- ජාතික අයවැයෙහි සෞඛ්‍ය වියදම් වෙන් කිරීම වියදම් ඇස්තමේන්තු පවතින වසංගත රෝග/සෞඛ්‍ය පරිපාලන දත්ත දැඩි ලෙස පදනම් කර ගනිමින් සකස් කළ යුතු බවට ව්‍යවස්ථාපිත වශයෙන් නියම කිරීම, එම දත්තවල නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සහ ජාතික/පළාත් අයවැය සකස් කිරීමේ දී එම අවශ්‍යතා වලින් බැහැරවීම සඳහා දැඩි කාර්ය පටිපාටි සපයාදීම වැනි සුදුසු සෞඛ්‍ය මූල්‍යකරණ යාන්ත්‍රණයන් අනුග මනය කිරීම මගින් ජනගහනයේ සෞඛ්‍ය අවශ්‍යතා පිළිබිඹු වන ආකාරයෙන් සාමාන්‍ය කාලවලදී මහජන සෞඛ්‍ය වියදම් සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන් කරනු ලබන බව සහතික කිරීම.

- මහජන සෞඛ්‍ය සම්පත් බෙදා හැරීමේදී කලාපීය අසමානතාවයන් අවම කිරීම සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතන සඳහා වන වාර්ෂික වියදම් ඇස්තමේන්තු විධිමත්, ඒකාකාරී ව්‍යුහයක් අනුගමනය කරන බවට සහතික වීම (සෞඛ්‍ය සේවා අවශ්‍යතාවල පවතින කලාපීය විෂමතා සැලකිල්ලට ගැනීම සඳහා සුදුසු නම්‍යශීලී බවක් සහිතව)

- පළාත්පාලන ආයතනවලට අයත් ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතනවලට ඒවායෙහි වියදම් ඇස්තමේන්තුවලට අනුකූලව සම්පත් වෙන් කර ඇති බව සහතික කිරීමේ දී පළාත් පාලන ආයතනවලට පැවරෙන කාර්යභාරය වැඩි දියුණු කිරීම.

- යම් සේවා සැපයීමක් ප්‍රතික්ෂේප කිරීමක් හෝ පෙර පැවති සත්කාර ප්‍රමිතීන් පහත දැමීමක් නිල ප්‍රතිපත්තියකට අනුකූලව පමණක් සිදු කරනු ලබන බවත්, එවැනි සියලු ම ප්‍රතිපත්ති රෝගීන්ට විධිමත් ලෙස සන්නිවේදනය කරන බවත් සහතික කිරීම පිණිස, යෝජිත මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා නීතිය මගින් ජාතික/පළාත් මට්ටමින් මෙන්ම, අදාළ වන විට එක් එක් සෞඛ්‍ය සේවා ආයතන මට්ටමින් ද සම්පත්/අයවැය නැවත වෙන් කිරීම/සංවිධානය කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් සකස් කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසිය යුතු ය.